(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 451.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 අප්‍රේල් මස 21 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4399/'13

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර දිස්ත්‍රික් වන නිලධාරී කොට්ඨාස කාර්යාලය මගින් පාලනය වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පයිනස් සහ වෙනත් වගාවන් වගා කර ඇති බව දන්නේද;

(iii) එලෙස වගා කර ඇති වනාන්තර බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වගා කර ඇති ඉඩම් අනවසරයෙන් පුද්ගලයින් විසින් අල්ලාගෙන ඇති බවත්;

(ii) එම ඉඩම්වලින් කොටසක් රජය මගින් මහජනතාව සඳහා ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ)(iii) හි සඳහන් වනාන්තර භූමි ප්‍රදේශයෙන් පුද්ගලයින් අනවසරයෙන් පදිංචි වී ඇති ඉඩම් ප්‍රමාණය හා රජය මගින් මහජනතාවට ලබාදී ඇති බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත වනාන්තර භූමි ඉහත පරිදි මිනිසාගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නිසා ජල පෝෂක ප්‍රදේශ විනාශ වී යන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4773/'14

2.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රෝහල්වල ඖෂධ හිඟයට පිළියමක් ලෙස ප්‍රාදේශීය වශයෙන් ඖෂධ මිලදී ගැනීම සඳහා අවසර දී තිබේද;

(ii) ඒ සඳහා මිල ගණන් ලබා ගන්නා ආකාරය කවරේද;

(iii) එම මිල ගණන් වෛද්‍ය සැපයුම් අංශය සමග සංසන්දනය කිරීමට වැඩ පිළිවෙළක් තිබේද;

(iv) පේරාදෙණිය මහ රෝහලේ ඖෂධ මිලදී ගැනීම්වලදී සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5245/'14

3\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1995.10.11 දින සිට ක්‍රියාත්මක වූ ගොවි විශ්‍රාම වැටුපට අදාළ නව වැඩපිළිවෙළ අනුව එම වැටුප ලබමින් සිටියදී මිය ගිය අයෙකුගේ කලත්‍රයාට හෝ යැපෙන්නාට හිමි මාසික විශ්‍රාම වැටුප 2014.01.01 දින සිට ගෙවීමට ක්‍රියා කරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014.01.01 දින සිට ආරම්භ වූ නව වැඩපිළිවෙළ අනුව 1987 වර්ෂයේ දී එවකට විසිහත්වන වියේ සිටියදී එකවර රු. 3400/- ක මුදලක් ගෙවා ගොවි විශ්‍රාම වැටුප් හිමිකම ලැබූ අයෙකු, 2010 වර්ෂයේදී එවකට හතලිස් පස්වන වියේ සිටියදී එකවර රු. 5740/- ක මුදලක් ගෙවා ඊට දායක වූ අයෙකු සහ 1987 වර්ෂයේදී විසිහත්වන වියේ සිටියදී ගොවි විශ්‍රාම වැටුපට අර්ධ වාර්ෂික වාරිකය ලෙස රු. 175/- ක මුදලක් ගෙවමින් සිටි අයෙකු ඔවුන්ගේ විශ්‍රාම වැටුපට හිමිකම් ලබා ගැනීම සඳහා අමතර මුදලක් ගෙවිය යුතු වන්නේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් එම එක් එක් අවස්ථාවට අදාළව, එම පුද්ගලයින් ගෙවිය යුතු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5906/'15

4\.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගේ මිනිස් ශ්‍රමය යොදා ගැනීමේදී ඔවුන්ට වේතනයක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම වේතනය කොපමණද;

(iii) එම වේතනය අවසාන වරට සංශෝධනය කළ දිනය කවරේද;

(iv) වර්තමාන තත්ත්වයන්ට අනුව එම වේතනය වැඩි කළ යුතුව තිබෙන බව දන්නේද;

(v) බ්‍රිතාන්‍යය වැනි රටවල සිරකරුවන් සඳහා මසකට පවුම් 200 ලබා දෙන වාතාවරණයක් තුළ මෙරට සිරකරුවන්ට දැනට ලබා දෙන වේතනය වැඩි කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5913/'15

5.

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආර්ථික සංවර්ධන, ඵලදායිතා ප්‍රවර්ධන ඇතුළු එවකට පැවති අමාත්‍යාංශ කිහිපයක් අහෝසි කර එම අමාත්‍යාංශයන්ට අනුයුක්තව සේවය කළ සංවර්ධන නිලධාරීන් ඉටු කළ කාර්යයන් අත්හිටුවා ඇති බවත්;

(ii) එබැවින් එම නිලධාරීන් දහස් ගණනක් මේ වන විට කිසිදු රාජකාරියක් නොමැතිව සිටින බවත්;

(iii) ඔවුන්ට කාර්යාල පවත්වාගෙන යෑමට රජයෙන් ලබා දී තිබූ දීමනාවද මේ වන විට අහෝසිකර ඇති බවත්;

(iv) එම හේතුවෙන් බදු පදනම මත භාවිතා කළ කාර්යාල ගොඩනැගිලිවලින් ඉවත්වීමට සිදුවී ඇති බවත්;

(v) එබැවින් එම කාර්යාලවලට ලබා දී තිබූ රජයේ දේපළ අනාරක්ෂිත තත්ත්වයකට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් කරුණු සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) ඉහත සඳහන් අමාත්‍යාංශයන්හි දැනට සේවය කරන සංවර්ධන නිලධාරීන් සහ බඳවා ගත් උපාධිධාරීන් විධිමත් ලෙස රාජ්‍ය සේවයට ඇතුළත් කොට උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දෙන බවට දින 100 වැඩසටහනෙහි සඳහන් පොරොන්දුව පරිදි එම නිලධාරීන් දින 100 ඇතුළතදී ඵලදායී කාර්යයක යොදවන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5916/'15

6.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින පැවති ජනාධිපතිවරණයෙන් පසු දේශපාලනික හෝ වෙනයම් හේතු මත පොලිස් හෝ වෙනත් ආරක්ෂක අංශවල පරීක්ෂාවන්ට ලක්වූ කතෝලික දේවස්ථාන, හින්දු ආගමික ස්ථාන සහ මුස්ලිම් දේවස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ පරීක්ෂාවට ලක්කළ එක් එක් අදාළ ආගමික ස්ථානයේ නම, ලිපිනය, දුරකථන අංකය පරීක්ෂාවට ලක් කළ දිනය සහ ඊට අදාළ වූ හේතූන්, කතෝලික, හින්දු සහ මුස්ලිම් යන ආගමික ස්ථාන අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6018/'15

7\.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ රහසිගත රැඳවුම් කඳවුරු තිබේද;

(ii) එසේ නම්, එම කඳවුරු පිළිබඳ විස්තර කවරේද;

(iii) එම කඳවුරුවල රඳවා තබා සිටින රැඳවියන් කවුරුන්ද;

(iv) ඔවුන් පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

6036/ 15

8\.

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජිනීවාහි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත තනතුරෙහි සිටි තමරා කුනනායගම් මහත්මිය වර්ෂ 1989 සිට 1990 දක්වා කාල පරිච්ඡේදය තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නියෝජිතවරියක ලෙස කටයුතු කළ බවට "ස්වර්ණවාහිනී" නාලිකාව සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කළේද;

(ii) එසේ නම්, එකී ප්‍රකාශය සිදු කරන ලද්දේ කවර සාක්ෂි පදනම් කරගෙනද;

(iii) එකී සාක්ෂි වැදගත්කමකින් යුතුයැයි සළකනු ලබන්නේ නම්, කුනනායගම් මහත්මිය නෙරපීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත අ(i) හි සඳහන් කාල පරිච්ඡේදය තුළ සහ ඒ ආසන්න කාලයේදී කුනනායගම් මහත්මිය මානව හිමිකම් ක්‍රියාකාරිණියක් වශයෙන් කටයුතු කළ බවත්, ඇය අමාත්‍යවරයා ද සම්බන්ධවී සිටි "මව්වරුන්ගේ පෙරමුණ" නමැති සංවිධානයේ ක්‍රියාකාරකම්වලට සහයෝගය දක්වමින් කටයුතු කළ බවත් එතුමා දන්නෙහිද?

(ඇ) කුනනායගම් මහත්මිය ත්‍රස්තවාදයට අනුකම්පාව දක්වන බවට චෝදනා කිරීමට හේතුව වන්නේ ඇය මානව හිමිකම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී වීමද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

4534/'13

9\.

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1980 ජුලි වර්ජනයේදී රැකියා අහිමි වූ, මෙතෙක් සහනයක් නොලැබුණු පුද්ගලයින්ට රු. 5000.00ක දීමනාවක් ලබා දෙන බවට වූ 2013 අය වැය යෝජනාව අනුව, මේ දක්වා එම දීමනාව ලබා දී ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දීමනාව ලබා දීම සඳහා රජය විසින් මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම ආරම්භ වන විට කිසිදු ප්‍රතිලාභයක් නොලබාම මිය ගොස් සිටි ජූලි වර්ජකයින්ට හිමි එකී ප්‍රතිලාභය අදාළ හිමිකරුවන් වෙත ලබා දීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) 1980 ජූලි වර්ජනයට සහභාගී වී මෙතෙක් සහනයක් නොලැබූ අයකු ඉහත සඳහන් මුදල ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4778/'14

10\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සමස්ත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් සභා යටතේ ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 අයවැය මගින් පළාත් සභා යටතේ වන රෝහල්වල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා වූ වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබේද;

(iv) එම වැඩ සටහන් යටතේ පළාත් සභා මගින් ප්‍රාදේශීය රෝහල් සඳහා අවශ්‍ය නොවන උපකරණ බෙදා හැර තිබූ බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(iii)හි සඳහන් වැඩ සටහන යටතේ පළාත් සභා රෝහල් සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය එක් එක් පළාත් සභාව අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5575/'14

11\.
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට ක්‍රියාත්මක වන ආයුර්වේද පනත හඳුන්වා දුන් වර්ෂය කවරේද;

(ii) මේ වන විට එම පනත සංශෝධනය කර ඇති වාර ගණන කොපමණද;

(iii) එය අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iv) මෙතෙක් එම පනත සංශෝධනය කර නොමැති නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් හඳුන්වනු ලබන්නේ වෛද්‍ය නිලධාරීන් ලෙස ද; නැතහොත්, වෛද්‍ය වෘත්තිකයන් ලෙස ද;

(ii) ඔවුන් එම නාමයෙන් හැඳින්වීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5917/'15

12.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනාධිපතිවරණයේ තැපැල් ඡන්දය පැවති 2014.12.23 දින ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවකයෙකුට දේශපාලනඥයකු හා ඔහුගේ ආරක්ෂකයන් විසින් පහරදීමක් සිදුකර ඇති බවත්;

(ii) එම පහරදීම හේතුවෙන් පහර කෑමට ලක්වූ අය රෝහල් ගතව සිටි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු ද වන සඳුන් හේමන්ත නමැති එම සේවකයාට දේශපාලන හේතු මත සිදු කරනු ලැබූ එම පහරදීම පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iii) චෝදනා ලබා ඇති පුද්ගලයන්ගේ නම් සහ අනෙකුත් තොරතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4538/'13

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 අය වැය යෝජනා මගින් විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින්ගේ නිපුණතා ඉහළ මට්ටමට ගෙන ඒම සඳහා සහ එම රටවල සමාජ හා සංස්කෘතික පරිසරයට අනුගත වීම පහසු කිරීම සඳහා සුවිශේෂ පාඨමාලා ඇතුළත් නව විදේශ රැකියා තාක්ෂණික විද්‍යාල දෙකක් පිහිටුවීමට යෝජනා කළ බව දන්නේද;

(ii) එම විද්‍යාල දෙක පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා ආයෝජනය කළ මුළු මුදල කොපමණද;

(iv) එම තාක්ෂණික විද්‍යාලවල පුහුණුව ලබාදෙන රැකියා ක්ෂේත්‍ර කවරේද;

(v) මේ වන විට එම ආයතන වෙතින් පුහුණුව ලබා විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇති රටවිරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4781/'14

14.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින තුළ මේ වන විට ඖෂධ මිල පාලනයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) කලකට පෙර දී ශ්‍රී ලංකාව තුළ ඖෂධ මිල පාලනයක් ක්‍රියාත්මක වූ බව දන්නේද;

(iii) එසේ නම්, එම මිල පාලනය ක්‍රියාත්මක වූ කාල සීමාව කවරේද;

(iv) එම කාල සීමාව තුළදී මිල පාලනය සිදු කළ ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(v) ඖෂධ මිල පාලනය සඳහා පත් කර ඇති කමිටුව මේ වන විට ඊට අදාළ නිර්දේශ ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5576/’14

15.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ උපාධිධාරීන්ට රැකියා ලබාදීම සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවේදී ඒ සඳහා ඉල්ලුම් කර තිබූ ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් රැකියා ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011.12.31 දින වන විට රැකියා විරහිතව සිටි ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2012 වර්ෂයේදී ඔවුන්ට රැකියා ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකසා තිබුණේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iv) ඒ යටතේ රැකියා ලබා දුන් ආයුර්වේද වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 10 සිට 15 දක්වා විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2015 අප්‍රේල් මස 22 වැනි බදාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2015 අප්‍රේල් මස 22 වැනි බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

මුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 32 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,700,000,000 සිට රු. 2,200,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 6,102,000,000 සිට රු. 6,602,000,000 දක්වා |

| | | | |
|---|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 850,000,000 සිට රු. 1,000,000,000 දක්වා | |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 33 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 33 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 24702 "අත්අඩංගුවට ගන්නා ලද හා රාජ සන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 20,000,000 රු. 25,000,000 | සිට දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 34 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 34 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 “පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව” වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,900,000,000<br>රු. 2,500,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,500,000,000<br>රු. 2,250,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 “ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව” වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000<br>රු. 170,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව — සංශෝධන නොමැත

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවි කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 " කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට<br>රු. 450,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවි කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2014 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව මට පැවරී ඇති බලතලවලට අනුව ගරු රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතියට යටත්ව මේ සමග දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල පහත දැක්වෙන විෂය අංකවලට අදාළ වන්නා වූ පනතේ තෙවන උපලේඛනයේ තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක IIIහි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි. 14001, 18201, 10501, 22801, 20801, 27701, 30301, 26901, 27001, 27201, 24201, 28601, 10201, 25601, 25801, 28201, 28501, 11601, 28801, 30601, 27901, 27801, 27401, 27501, 21901, 17801, 12601, 11101, 18801, 21101 සහ 19001.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට රු. | දක්වා රු. | සිට රු. | දක්වා රු. | සිට රු. | දක්වා රු. | |
| 1 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 14001 | 7,000,000 | 10,000,000 | 3,700,000 | 4,000,000 | - | - | 1 |
| 2 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශය | 18201 | 5,000,000 | 8,000,000 | 1,100,000 | 4,100,000 | - | - | 2 |
| 3 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 10501 | 140,000,000 | 170,000,000 | 60,000,000 | 90,000,000 | - | - | 3 |
| 4 | අධිකරණ අමාත්‍යාංශය | 22801 | 260,420,000 | 290,420,000 | 170,000,000 | 175,000,000 | 850,000,000 | 1,100,000,000 | 4 |
| 5 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 20801 | 9,000,000 | 12,000,000 | - | - | - | - | 5 |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 27701 | - | - | 25,000,000 | 24,000,000 | - | - | 6 |
| 7 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 30301 | - | - | 3,000,000 | 2,900,000 | - | - | 7 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මඩකලපුව | 26901 | - | - | 23,000,000 | 18,000,000 | 90,000,000 | 100,000,000 | 8 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - අම්පාර | 27001 | - | - | 35,000,000 | 30,000,000 | - | - | 9 |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 27201 | - | - | 75,000,000 | 65,000,000 | - | - | 10 |
| 11 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 24201 | - | - | 2,000,000 | 1,700,000 | - | - | 11 |
| 12 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 28601 | - | - | 12,000,000 | 11,500,000 | - | - | 12 |
| 13 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 10201 | 15,000,000 | 12,000,000 | 9,500,000 | 8,500,000 | - | - | 13 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 25601 | - | - | 56,000,000 | 53,000,000 | - | - | 14 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 25801 | - | - | 51,000,000 | 46,000,000 | - | - | 15 |
| 16 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 28201 | - | - | 100,000,000 | 97,000,000 | - | - | 16 |
| 17 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28501 | - | - | 150,000,000 | 120,000,000 | - | - | 17 |
| 18 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 11601 | 6,000,000 | 7,500,000 | - | - | - | - | 18 |
| 19 | මිනුම්පති දෙපාර්තමේන්තුව | 28801 | - | - | 100,000,000 | 86,000,000 | - | - | 19 |
| 20 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | 385,000,000 | 290,000,000 | - | - | 20 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 27901 | - | - | 30,000,000 | 26,000,000 | - | - | 21 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 27801 | - | - | 38,000,000 | 32,000,000 | - | - | 22 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර | 27401 | - | - | 40,000,000 | 35,000,000 | - | - | 23 |
| 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොලොන්නරුව | 27501 | - | - | 18,000,000 | 15,000,000 | - | - | 24 |
| 25 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 21901 | 8,000,000 | 8,011,000 | - | - | - | - | 25 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය | 17801 | 4,000,000 | 5,000,000 | - | - | - | - | 26 |
| 27 | අධ්‍යාපන අමාත්‍යාංශය | 12601 | - | - | 680,000,000 | 675,000,000 | - | - | 27 |
| 28 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 11101 | - | - | 710,000,000 | 653,000,000 | - | - | 28 |
| 29 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 18801 | 2,000,000 | 2,060,110 | - | - | - | - | 29 |
| 30 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 21101 | - | - | 45,000,000 | 44,000,000 | - | - | 30 |
| 31 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | 19001 | - | - | 83,000,000 | 60,000,000 | - | - | 31 |
| | එකතුව | | 456,420,000 | 524,991,110 | 2,905,300,000 | 2,666,700,000 | 940,000,000 | 1,200,000,000 | |

අත්සන් කළේ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015 අප්‍රේල් 10 දින
කොළඹ 01.



(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*22.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*23.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

24.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

26.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

27.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

28.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

***** *සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.